# සමාජ ප්‍රතිසන්ධානය සඳහා ආගමේ දායකත්වය*

**අයි. ජී. එන්. ප්‍රභාෂිණී**[1]

**සංක්ෂේපය**

සුරක්ෂිත සමාජයක අඩිතාලම සකසනු ලබන්නේ මානව ගුණධර්මවලින් පිරිපුන් පුද්ගලයන්ගේ සමාජීය ක්‍රියාකාරකම්ය. මානවයාගේ ක්‍රියාකාරකම් සමාජයක් එක්සත් කිරීමට මෙන්ම සමාජය තුළ බිඳවැටීම් ඇතිකිරීමට ද හේතු වේ. එකිනෙකාට ගෞරව කිරීම, සහජීවනය, සහයෝගය, ගැටුම් අවම තත්ත්වයක් තුළ සංහිඳියාවෙන් පිරි සමාජයක් ගොඩනැගීම සිදුවේ. පුද්ගල මානව ගුණධර්ම පවත්වාගැනීම කෙරෙහි ආගම ප්‍රබල බලපෑමක් ඉටුකරනු ලබයි. ඒ අනුව රටක, සමාජයක සංවර්ධනය, යහපැවැත්ම සඳහා ආගම සුවිශේෂී කාර්යභාර්යයක් ඉටුකරනවා සේම එය සමාජ ප්‍රතිසන්ධානය සඳහා ද හේතු වේ. එහිදී ආගමික ඉගැන්වීම් මෙන්ම ආගමික නායකයන්ගේ යහපත් මගපෙන්වීම් ද මානව ක්‍රියාකාරකම් සඳහා හේතු වේ. ගැටුම්, පීඩාකාරී තත්ත්වයන් හමුවේ හුදෙකලා වූ ජනතාව එකට එකතු කොට සමාජය යථා තත්වයට පත්කරගැනීම සඳහා සමාජ ප්‍රතිසන්ධානය අත්‍යවශ්‍ය වේ. සමාජ ප්‍රතිසන්ධානය ගොඩනැගීම සඳහා සමාජමය, සංස්කෘතිකමය, දේශපාලනික, නෛතික සහ මනෝවිද්‍යාත්මක ආදී වශයෙන් සෑම අංශයකම දායකත්වය තුළ ආගම සුවිශේෂී දායකත්වයක් සපයනු ලබයි.

***මූඛ්‍ය පදඃ*** *ආගම, මානව ක්‍රියාකාරකම්, මානව ගුණධර්ම, සමාජය සුරක්ෂිතතාව*

[1] *කථිකාචාර්ය (ආධුනික), සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. Email:* prabhashini@sjp.ac.lk

**හැඳින්වීම**

සමාජ ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය අන්තර් පුද්ගල සබඳතාවල සිට විශාල සමාජ බෙදීම් හෝ ගැටුම් දක්වා විවිධ මට්ටම්වලින් සිදු විය හැකිය. අතීත වැරදි පිළිගැනීමට, සමාජ සංසිද්ධීන් පිළිබඳ පවත්නා විවිධ දෘෂ්ටිකෝණයන් තේරුම් ගැනීමට සහ අන්‍යෝන්‍ය අවබෝධය සහ ගෞරවය සඳහා ක්‍රියා කිරීමට පීඩාවට පත් පාර්ශවයන්ගෙන් සහ සමාජයෙන් සිදුකරනු ලබන ඒකාබද්ධ උත්සාහය මත සමාජ ප්‍රතිසන්ධානය ගොඩනැගිමට හැකියාව ලැබේ. එම ක්‍රියාවලිය තුළ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා ආරම්භ කිරීම, ප්‍රජා සංවාද, අධ්‍යාපන වැඩසටහන්, වන්දි ගෙවීම් හෝ වෙනත් ආකාරයේ ප්‍රතිෂ්ඨාපයන් සඳහා අවශ්‍ය ආරම්භයන් ගොඩනැගීම සිදුවේ. එහි අරමුණ වී ඇත්තේ සමාජ සංදර්භය තුළ පිටට මතු වී නොපෙනෙන එහෙත් අභ්‍යන්තරයේ පවතින ගැටළු විසඳීම, එකිනෙකා අතර අවබෝධය වර්ධනය කිරීම සහ සමාජයේ සාමාජිකයින් අතර සමගිය ගොඩනගනු ලබන සහ ඔවුනොවුන්ගේ බෙදාහදාගත් වගකීම පිළිබඳ හැඟීමක් පෝෂණය කිරීම මගින් වඩාත් සාධාරණ සුරක්ෂිත සමාජයක් නිර්මාණය කිරීමයි. මෙකී සමාජ ප්‍රතිසන්ධානය සඳහා ආගමේ දායකත්වය පිළිබඳ විමසා බැලීමේදී සුරක්ෂිත සමාජයක් බිහිකිරීමෙහි ලා සුවිශේෂී මෙහෙවරක් ඉටුකරනු ලබන ආයතනයක් වශයෙන් ආගමික සංස්ථාව හඳුනාගත හැකිය. මානව ජීවියා මව් කුස පිළිසිඳගත් දා පටන් සමාජානුයෝජනයට ලක්වන අතර එහි දී පවුල, පාසල, සම වයස් කණ්ඩායම්, මහා සමාජය ආදී වශයෙන් සමාජානුයෝජන කාරක ඔස්සේ සමාජානුයෝජනයට ලක්වීමේදී ආගමේ බලපෑම සුවිශේෂී වේ. ඒ අනුව සමාජ ප්‍රතිසන්ධානය සඳහා මානව ක්‍රියාකාරකම්වල ඇති ගුණාත්මකභාවය කෙරෙහි ආගමේ දායකත්වයෙහි ප්‍රභලත්වය හඳුනාගතහැකිය. මෙම ලිපියේ පර්යේෂණ අරමුණ වනුයේ සමාජ ප්‍රතිසන්ධානය ගොඩනැගීම සඳහා ආගමේ දායකත්වය කවරාකාරද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීමයි. එහි දී අධ්‍යයන ක්‍රමවේදය ලෙස මේ පිළිබඳ ලිය වී ඇති පර්යේෂණ පත්‍ර ප්‍රමුඛ ද්විතියික මූලශ්‍ර භාවිතා කර ඇත. එම ද්විතියික මූලාශ්‍රයන් භාවිතා කරමින් විශ්ලේෂණාත්මක හා සංශ්ලේෂණාත්මක විග්‍රහයක් මෙහි අන්තර්ගත වේ.

**සමාජ ප්‍රතිසන්ධානය යනු**

සමාජ ප්‍රතිසන්ධානය යනු බෙදීම්, ගැටුම්, පීඩාකාරී තත්ත්වයන් හෝ ආතතිය අත්විඳින ලද සමාජයක් තුළ එකිනෙකා අතර සහජීවනය පවත්වාගැනීම සහ පුද්ගලයා සිය සමාජ ජීවිතය තුළ යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලිය ලෙස සරලව හැඳින්විය හැකිය. එහිදී එකී සමාජ සංදර්භය තුළ ඔවුනොවුන්ගේ වැරදි පිළිගැනීම, එකිනෙකාට සමාව දීම, සමාජය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ විවිධ කණ්ඩායම් හෝ පුද්ගලයන් අතර විශ්වාසය යළි ගොඩනැගීමට දරන උත්සාහය වැනි විවිධ ක්‍රම ඔස්සේ සමාජ සංදර්භය තුළ පවත්නා අසාධාරණයන් හෝ ගැටුම් ආමන්ත්‍රණය කිරීම සිදුවේ. සමාජ ප්‍රතිසන්ධානය නිර්වචනය කරගැනීමේදී Bar-Tal සහ Bennik ප්‍රතිසන්ධානය දකින්නේ වැඩසටහනක් හෝ සිදුවීමක් ලෙස නොවේ. එනමුත් වැදගත්කම අවධාරණය කරමින් දිගුකාලීන නියැලීමක් අවශ්‍ය වන, ඉලක්කයක් සහිත, සංහිඳියාව පෙරදැරිකරගත්, ආකල්ප අනුගමනය කරනු ලබන, විවේචනාත්මක ජනතාවගේ රැස්කිරීමක් වශයෙනි (Odak, 2021). එලෙසම ප්‍රතිසන්ධානය යන්නෙන් අදහස්

කරන්නේ සමාජගත පුද්ගලයන්ගේ සබඳතා ගොඩනගා ගැනීම සම්බන්ධ ක්‍රියාකාරකම්, භාවිතයන් සහ ක්‍රියාවලීන් ඔස්සේ 'තිරස්' සබඳතා සහ 'සිරස්' සබඳතා ගොඩනැගීම පිළිබඳ ක්‍රියාවලියකි (The University of Edinburgh/Project on Religion and Ethics in the Making of War and Peace, and the Center for Empirical Research on Religion in Bosnia and Herzegovina, 2013). ප්‍රතිසන්ධානය යනු සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර එයින් අදහස් වන්නේ බෙදුණු සමාජය, එකට ජීවත් වීමට බිඳුණු සබඳතා යථා තත්ත්වයට පත් කිරීමට පොදු අනාගතයක් නිර්වචනය කිරීමට සහ ප්‍රචණ්ඩත්වයෙන් තොරව රැඩිකල් වෙනස්කම්වලට ඉඩ සැලසීමකි (Omerovic, 2017). මේ අනුව සමාජ ප්‍රතිසන්ධානය, සමාජ ඒකාබද්ධතාවක් ගොඩනැගීම කෙරෙහි දක්වන දායකත්වය හඳුනාගත හැකිය.

සමාජ ප්‍රතිසන්ධානය පිළිබඳ අර්ථ විවිරණය කිරීමේදී සමාජවිද්‍යාත්මක, දේශපාලනික, මනෝවිද්‍යාත්මක ආදි වූ විවිධ දෘෂ්ටිපථ හරහා මෙම සංකල්පය අවබෝධකරගැනීමේ හැකියාව ඇත. නෛතික දෘෂ්ටිකෝණය සම්බන්ධව අවධානය යොමුකිරීමේදී සමාජ ප්‍රතිසන්ධානය යනු සමාජ බෙදීම්, ගැටුම් හෝ සමාජ අසාධාරණයන් ආමන්ත්‍රණය කිරීමයි. සමාජ ප්‍රතිසන්ධානය පිළිබඳ නෛතික දෘෂ්ටිකෝණය තුළ නීතිමය දිශානතීන් සහ ලක්ෂණ රැසකි. ඒ අනුව පුනරුත්ථාපනය පිළිබඳ අවධානය යොමුකිරීමේදී අපරාධ හෝ ගැටුම් හේතුවෙන් ඇති වන හානිය පිළිසකර කිරීම සඳහා විපතට පත් පාර්ශවයන් විසඳුම් සෙවීමට සම්බන්ධ කර ගැනීම සිදුවේ. ප්‍රතිසන්ධානය සඳහා පහසුකම් සැලසීම සඳහා සමථකරණය, ප්‍රජා සම්මන්ත්‍රණ වැනි ප්‍රතිෂ්ඨාපන පිළිවෙත් නීති පද්ධතියට ඇතුළත් කර ඇත. එමෙන්ම ප්‍රතිසන්ධානය සඳහා නීතිමය රාමුව සහ නීතිමය යාන්ත්‍රණය ඉතා වැදගත් වේ. මෙහිදී විවිධ කොමිෂන් සභා, නඩු පැවරීම්, වන්දි ගෙවීම සහ අතීතයේදී සිදු වූ මානව හිමිකම් උල්ලංඝන හෝ සමාජ අසාධාරණයන් ආමන්ත්‍රණය කිරීම සඳහා ආයතනික ප්‍රතිසංස්කරණ වැනි විවිධ නීතිමය යාන්ත්‍රණයන් ඇතුළත් වේ. සමාජ ප්‍රතිසන්ධානයේදී අපරාධකරුවන්, වින්දිතයන් සහ ප්‍රජාව අතර මැදිහත්වීම, ප්‍රතිස්ථාපනය කිරීම, සාපරාධී හැසිරීම් හේතුවෙන් සිදුවන හානිය වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කරයි (Sundqvist, 2011). එලෙසම සමාජ පද්ධතිය තුළ අසමානතා හෝ අසාධාරණයන් විසඳීම සඳහා නව නීති ක්‍රියාත්මක කිරීම හෝ පවතින නීති සංශෝධනය කිරීම ද සමාජ ප්‍රතිසන්ධානයේදී සිදු කරනු ලබයි. එලෙසම අයුක්තිය හෝ වෙනස් කොට සැලකීම් අතීත තීරණ හෝ නීති සමාලෝචනය කර නිවැරදි කිරීම අධිකරණය විසින් සිදුකරනු ලබයි.

**සමාජ ප්‍රතිසන්ධානය තුළ දැකිය හැකි අංග ලක්ෂණ**

සමාජ ප්‍රතිසන්ධානය පිළිබඳ සමාජ බෙදීම් හෝ අයුක්තියෙන් පසුව නැවත නිවැරදි කිරීමට සබඳතා යළි ගොඩනගා ගැනීමට සහ සමගිය පිළිබඳ හැඟීම පෝෂණය කිරීමට ප්‍රජාවන් එකට එක්වන ආකාරය කෙරෙහි අවධානය යොමු කරයි. මිනිසුන් අතර අන්‍යෝන්‍ය ගෞරවය ප්‍රවර්ධනය කිරීම මෙහිදී හඳුනාගතහැකි තවත් ලක්ෂණයකි. විවිධත්වය සඳහා පවත්වනු ලබන උත්සවයන්හිදී සංස්කෘතික

භාවිතයන්වලදී විවිධ සම්ප්‍රදායන් හුවමාරු කර ගැනීම සමාජ ප්‍රතිසන්ධානයේදී සිදුවේ.

ගැටුම් හෝ අයුක්තිය නිසා පීඩාවට පත් වූ පුද්ගලයන්ට සහ ප්‍රජාවන්ට මානසික සහනය ලබා දීම මෙන්ම අතීත මතකයන් අනුස්මරණය කිරීම සමාජ ප්‍රතිසන්ධානය තුළ දැකිය හැකි තවත් ලක්ෂණයකි. සමාජ ප්‍රතිසන්ධානයේදී කම්පනයට පත් ජනතාවගේ මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා උපදේශනය සහ ප්‍රතිකාර, වෘත්තීය සෞඛ්‍ය සේවා ලබා දීම සිදුවේ. සමාජ ප්‍රතිසන්ධානය තුළ දැකිය හැකි සුවිශේෂී කාර්යයක් ලෙස සමාජයේ සියලුම කොටස් තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා සම්බන්ධ කර ගැනීම දැක්විය හැකිය. එලෙසම තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ සවිබල ගැන්වීමේ වැඩසටහන්, අධ්‍යාපනය සහ සමාජයේ ක්‍රියාකාරී සහභාගීත්වය සඳහා ඇති අවස්ථා හරහා පුරවැසියාට සහාය වීම සිදු වේ (Jayathilaka & Ansari, 2019). එලෙසම සමාජ සාධාරණත්වය, සමානාත්මතාවය සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් සමාජ ප්‍රතිසන්ධානය ඉතා වැදගත් වන අතර සමාජ ආර්ථික සහ දේශපාලන පද්ධති තුළ ව්‍යුහාත්මක අසමානතා සහ අසාධාරණයන් හඳුනා ගැනීම සහ ඊට ආමන්ත්‍රණය කිරීම ද ඒ හරහා සිදුවේ. සමාජ ප්‍රතිසන්ධානය තුළ නීතිය ක්‍රියාත්මක කරන්නන් සහ ප්‍රජාව අතර විශ්වාසය ගොඩනැගීම සඳහා ප්‍රජා-නැඹුරු පොලිස් සේවය ව්‍යාප්ත කිරීම, ගැටුම් හෝ සාපරාධී ක්‍රියාවලට සම්බන්ධ වූ පුද්ගලයන් නැවත සමාජයට සම්බන්ධ කිරීමට සහාය වීම ද දක්නට ලැබේ. මේ අනුව සමාජ ප්‍රතිසන්ධානය තුළ සබඳතා යළි ගොඩනගා ගැනීමට සහ වඩාත් සමෝධානික සහ සුහදශීලී සමාජයක් නිර්මාණය කිරීම, සමාජ සාධාරණත්වය ඔසවාතැබීම කෙරෙහි අවධාරණය කරයි. සමාජ ප්‍රතිසන්ධානය තුළ සිදුකෙරෙන කාර්යභාර්යයන් අතර ආන්තික කණ්ඩායම්වල හෝ වින්දිතයන්ගේ නෛතික අයිතිවාසිකම් නීති පද්ධතිය මගින් ආරක්ෂා කර බලාත්මක කිරීම, සහතික කිරීම තවත් කාර්යයක් ලෙස පෙන්වා දිය හැකිය. එලෙසම රජයන් විසින් ප්‍රතිසන්ධානය අරමුණු කරගත් ප්‍රතිපත්ති සම්පාදනයන් ද සිදුකරනු ලැබේ.

**සමාජ ප්‍රතිසන්ධානය සඳහා ආගමේ දායකත්වය**

ආගම යනු පුළුල් පරාසයක විශ්වාසයන්, පිළිවෙත්, චාරිත්‍ර-වාරිත්‍ර සහ සදාචාරාත්මක වටිනාකම් ඇතුළත් සංකීර්ණ සහ බහුවිධ සංකල්පයකි. ආගමික සම්ප්‍රදායන්වලට බොහෝ විට තනි තනිව හෝ සාමූහිකව සිදු කරනු ලබන චාරිත්‍ර, උත්සව, යාච්ඤා සහ වෙනත් පිළිවෙත් ඇතුළත් වේ. ආගම අනන්‍යතාවයේ ගැඹුරුම මට්ටම් ස්පර්ශ කරයි. ආගම කේන්ද්‍ර කොටගනිමින් යුද්ධය සඳහා මිනිසුන් බලමුළු ගැන්වුනු අවස්ථා ඇතත් කල්පවත්නා සාමය සඳහා ද ජනතාව බලමුළු ගන්වන ප්‍රධාන සාධකයක් ලෙස ආගම පෙන්වාදිය හැකිය. ලෝකයේ බොහෝ ප්‍රදේශවල ආගම ප්‍රචණ්ඩ ගැටුම්වලට දායක වී ඇති නමුත් බොහෝ අවස්ථාවලදී සමාජ ප්‍රතිසන්ධානයට කටයුතු කර ඇත (Smock, 2006). ආගම් බොහෝ විට ඔවුන්ගේ අනුගාමිකයින්ගේ හැසිරීම් වලට මඟ පෙන්වන සදාචාරාත්මක මූලධර්ම සපයයි. මෙම මාර්ගෝපදේශ සදාචාරය, යුක්තිය, දයානුකම්පාව සහ අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්විමේදී අවශ්‍ය මගපෙන්වීම ලබාදෙයි. ආගමික වශයෙන් ප්‍රජාවන් එක්රැස්වීම, සංවිධානගතවීම ආගම්වල පොදු

ලක්ෂණ වේ. ආගමික සම්ප්‍රදායන් සංකීර්ණ හා එකිනෙකට වෙනස් වේ. ඒවා විවිධ පුද්ගලයන් විසින් විවිධ ආකාරයෙන් අර්ථ දක්වා ඇත. මෙම මාර්ගෝපදේශය ආගම නිර්වචනය කරන්නේ "ජීවිතයේ ආරම්භය, අරුත සහ අරමුණ සම්බන්ධයෙන් අවබෝධ කරගත් භෞතික නොවන යථාර්ථයකට මානව ප්‍රතිචාරයක්" ලෙයසි (Steele, Patton, & Maassarani, 2023). ලොව පුරා ජනතාව විවිධ ආගම් අදහනු දැකිය හැකිය. ඒ අනුව ක්‍රිස්තියානි ආගම, ඉස්ලාම් ආගම, හින්දු ආගම ලොව ප්‍රචලිත ආගම් ලෙස දැක්විය හැකි අතර මිට අමතරව විවිධ ආගම් රැසක් දැකිය හැකිය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම ලෙස බෞද්ධාගම පෙන්වාදිය හැකි අතර සෙසු ආගමිකයන් ද සිටි.

විවිධ ආගමික ඉගැන්වීම්හි සමාජ ප්‍රතිසන්ධානය පිළිබඳ ඉගැන්වීම් විශ්වාසයන් සහ වටිනාකම් ගැඹුරින් මුල් බැස ඇත. එකී ආගම් විසින් ප්‍රජාවන් තුළ එකමුතුකම, සමාව දීම සහ යහගුණ ධර්ම පෝෂණය කිරීම සඳහා අද්විතීය මෙහෙයක් ඉටුකරනු ලබයි. බොහෝ ආගමික සම්ප්‍රදායන් සමාව අයැදීම පිළිබඳ සංකල්පය අවධාරණය කරයි. එහිදී සමාව ලබා ගැනීමට සහ අන් අයට සමාව දීමට පුද්ගලයන් දිරිමත් කරයි (Omerovic, 2017). සමාජගත පුද්ගලයන්ට ඔවුන්ගේ සෙසු සමාජීය පුද්ගලයන් සමග සමාදානයෙන් ජීවත්වීමට මාර්ගය පෙන්වා දෙයි. සමාජ සංහිඳියාව, එකමුතුකම සහ අන්තර්සබඳතා යළි පිහිටුවීම සංකේතවත් කරන විශේෂ ආගමික උත්සව හෝ චාරිත්‍ර හරහා සමාජ ප්‍රතිසන්ධානය ගොඩනැගීමට උත්සාහ කරයි. ඉස්ලාම් බැතිමතුන්ගේ රාමසාන් උත්සවය, බෞද්ධයන් විසින් ප්‍රධාන පොහොය දිනයන් අළලා සිදුකරනුලබන දන්සැල් ව්‍යාපාර, කතෝලික බැතිමතුන් නත්තල් උත්සවය කේන්ද්‍ර කොටගනිමින් සිදුකරනු ලබන තෑගි බෙදාදීම් ආදිය නිදසුන් ලෙස පෙන්වා දියහැකිය. එලෙසම ශ්‍රී ලංකාවේ උත්සවශ්‍රීයෙන් සමරනු ලබන සංස්කෘතික වටිනාකමක් ඇති සිංහල දෙමළ අලුත් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර හරහා ද සමාජ ප්‍රතිසන්ධානය ඇතිකිරීම සඳහා ඉඩප්‍රස්ථාව සලසා දෙනු ලබයි. අන්තර් ආගමික සහයෝගීතාව හරහා ආගමික බෙදීම් ජය ගැනීමට සහ පොදු අරමුණු කරා කටයුතු කිරීමට විවිධ ආගමිකයන් අතර අවබෝධය සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සිදු කරනු ලබයි. මේ සියලු කටයුතුවල අරමුණු අතර සමාජ ප්‍රතිසන්ධානය ප්‍රමුඛ කොට දැක්විය හැකිය.

බොහෝ ආගම් සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින අතර සමාජ අසාධාරණයන් ආමන්ත්‍රණය කිරීමට සහ වඩාත් සාධාරණ සමාජයක් ගොඩනැංවීම සඳහා කටයුතු කිරීමට ඒ ඒ ආගම අදහනු ලබන පිරිස දිරිමත් කරයි. ආගමික ආයතන බොහෝ විට පුණ්‍ය කටයුතුවල නිරත වන අතර අවශ්‍යතා සපුරාලීම සහ සමාජ සුබසාධනය ඔප්නැංවීමට කටයුතු කරයි. පුද්ගලයන්ට මානසික සුවය ඇති කිරීම සඳහා අධ්‍යාත්මික පිළිවෙත් ඇතුළු ආගමික ඉගැන්වීම් පුද්ගලයන්ගේ අන්තර්ක්‍රියාවලදී සහ ගැටුම් නිරාකරණයට මඟ පෙන්වන සදාචාරාත්මක මාර්ගෝපදේශ සපයයි. ඒ අනුව සමාජය තුළ සහජීවනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය තීරණ ගැනීමට පුද්ගලයන් දිරිමත් කිරීම සඳහා ආගමික නායකයින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි (Omerovic,2017).

ආගමික සම්ප්‍රදායන් විශේෂ වැදගත්කමක් ඇති සහ ගැඹුරු අර්ථයන් ප්‍රකාශ කරන සංකේත නිතර භාවිතා කරයි. මෙම සංකේත බොහෝ විට වැදගත් ආගමික සංකල්පවල අංගයන් නියෝජනය කරයි. උදාහරණ ලෙස බුද්ධාගම තුළ බෝධි වන්දනාව දැක්විය හැකිය. බොහෝ ආගම් මරණින් මතු ජීවිතයක් හෝ සසර ගමන පිළිබඳ අවධාරණය කරයි. මේ අනුව සමාජගත පුද්ගලයා තුළ ඔවුන්ගේ ක්‍රියාවන් සහ විශ්වාසයන් මත පදනම්ව මරණයෙන් පසු පුද්ගලයන්ට සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳව උනන්දුවෙන් පසුවෙයි. විවිධ ආගමික චාරිත්‍ර ඉටු කිරීමට අධ්‍යාත්මික මාර්ගෝපදේශ සැපයීමට සහ ආගමික ග්‍රන්ථ හරහා සංයමයක් සහිත පුද්ගලයන් බිහි කිරීමට ඒ ඒ ආගම් කටයුතු කරනු ලබයි. මානව අධ්‍යාත්මිකත්වයේ සහ සංස්කෘතික ඉතිහාසයේ පොහොසත් බව පිළිබිඹු කරන විශ්වාසයන්, පිළිවෙත් සහ සංස්කෘතික ප්‍රකාශන විවිධ ආගම් සතුව ඇති අතර ඒ සියල්ල සමාජ ප්‍රතිසන්ධානය ගොඩනගනු වස් දායක වේ.

සමාජ ප්‍රතිසන්ධානය සඳහා ආගමෙහි දායකත්වය පිළිබඳ තවදුරටත් අවධාරණය කිරීමේදී යහපත් මග පෙන්වීමක් ලබා දීම, සමාව දීම, සංවේදනය දැක්වීම, සහකම්පනය යනාදිය මගින් සමාජ ප්‍රතිසන්ධානය සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයයි (Steele, Patton, & Maassarani, 2023). සංහිඳියාව සඳහා අත්‍යවශ්‍ය වන යුක්තිය, දයානුකම්පාව සහ සාධාරණත්වය පිළිබඳ මූලධර්ම වෙත පුද්ගලයන්ට සහ ප්‍රජාවන්ට මඟ පෙන්වන සදාචාරාත්මක අවබෝධයක් ලබාදීම ආගම් විසින් බොහෝ විට සිදුකරනු ලබයි. එහිදී බොහෝ ආගමික සම්ප්‍රදායන් සමාව දීමේ සහ එකට එකතුවීමේ වැදගත්කම අවධාරණය කරයි (Omerovic, 2017). ආගමික ඉගැන්වීම් බොහෝ විට පුද්ගලයන්ට අතීත දුක්ගැනවිලි අත්හැරීමට සහ අන්තර්සබඳතා හොඳින් පවත්වාගැනීම සඳහා පදනමක් සපයයි. එලෙසම අන්‍යයන් කෙරෙහි අනුකම්පාව සහ සංවේදනය ඇති කිරීමට තම අනුගාමිකයන් දිරිමත් කරයි. අවබෝධය සහ මානව සංහිඳියාව සඳහා හිතැති පරිසරයක් නිර්මාණය කරයි. ආගමික චාරිත්‍ර වාරිත්‍ර සහ උත්සව මගින් සමාජ ප්‍රතිසන්ධානය ඇතිකිරීම සඳහා පුද්ගලයන් තුළ නව ආරම්භයක් සනිටුහන් කිරීමට සහ අතීත වේදනා සුවපත් කරගැනීමට උපකාර කරයි.

ආගමික නායකයින්ට සහ ආගමික ආයතනවලට විවිධ ආගමික ප්‍රජාවන් අතර අවබෝධය වර්ධනය කිරීම සහ සමාජ බෙදීම්වලට හේතු විය හැකි බාධක බිඳ දැමීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ හැකිය. බොහෝ ආගම් සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින අතර සංහිඳියාව සඳහා පදනම වන වඩාත් සාධාරණ සමාජයක් නිර්මාණය කිරීමට කටයුතු කරනු ලබයි. ආගම මගින් වැරදි ක්‍රියාවන් නිසා සිදුවන සමාජ හානිය අවම කිරීම සහ වින්දිතයන් සහ වැරදිකරුවන් අතර සබඳතා ප්‍රතිස්ථාපනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි (Sundqvist, 2011). ඒ ඒ ආගම් විසින් එකිනෙකාට ගෞරව කිරිම, ප්‍රේම කිරිම, සාමුහිකව කටයුතු කිරීම සඳහා මගපෙන්වීම් සිදුකරනු ලබයි. ඒ ඔස්සේ සමාජ ප්‍රතිසන්ධානය ගොඩනගනු වස් ආගම සහ ආගමික නායකයන්ගේ දායකත්වය සුවිශේෂී වේ.

ආගමික නායකයින්ට විවිධ ප්‍රජාවන් අතර සාමය සහ සංහිඳියාව ගොඩනැගීම සඳහා තීරණාත්මක භූමිකාවක් ඉටු කළ හැකිය (Tenaw, 2018). ඔවුන්ගේ ආගමික සම්ප්‍රදායන් තුළ මූලික ඉගැන්වීම් ඔස්සේ සදාචාරසම්පන්න ජීවිතයනට මඟ පෙන්වීම් සපයනු ලබයි. එම ඉගැන්වීම් බොහෝ විට සමාජ ප්‍රතිසන්ධානය සඳහා මහගු දායකත්වයක් සපයයි. ආගමික නායකයින්ට සාමය සඳහා ප්‍රබල උපදේශකයන් විය හැකිය. දේශනා, ප්‍රසිද්ධ ප්‍රකාශ සහ ඔවුන්ගේ ආගමික ප්‍රජාවන් සමඟ සම්බන්ධ වීම තුළින් අවිහිංසාව, ඉවසීම සහ සාමකාමී මාර්ග හරහා ගැටුම් නිරාකරණය කිරීම පිළිබඳ සමාජයට පණිවිඩ සංප්‍රේෂණය කළ හැකිය.

ස්වාභාවික විපත් හෝ සමාජ කැලඹීම් වැනි අර්බුදකාරී කාලවලදී බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට අධ්‍යාත්මික සුවය ලබා දීම සඳහා ආගමික නායකයින් බොහෝ විට සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි. ආගමික නායකයින්ට ඔවුන්ගේ ප්‍රජාවන්, අධ්‍යාපනය තුළින් ඔසවා තැබීම සඳහා බලපෑම් කළ හැකිය. එලෙසම ප්‍රජාව සවිබලගැන්වීම තුළ සමාජ ප්‍රතිසන්ධානය සඳහා උත්සාහදරනු ලබයි (Jayathilaka & Ansari, 2019). ඉවසීම, අවබෝධය සහ සාමකාමීත්වය, සහජීවනයේ වැදගත්කම පහදා දීම තුළ දිගු කාලීන ගැටුම් වළක්වා ගැනීමට දායකවිය හැකිය. සමාව දීමේ වැදගත්කම අවධාරණය කරමින් ආගමික නායකයන් තම අනුගාමිකයන්ට සතුරුකම් සහ අමනාපකම් අත්හැරීමට දිරිගන්වයි. සමාව දීම කෙරෙහි අවධානය යොමු කිරීම ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේ ප්‍රධාන අංගයක් වශයෙන් සැලකිය හැකිය. ආගමික නායකයින් බොහෝ විට මානව හිමිකම් සහ සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින අතර ගැටුම් සහ අසමානතාවයට ආමන්ත්‍රණය කරනු ලබයි. විවිධ ප්‍රජාවන් අතර අවබෝධය සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ආගමික නායකයින්ට පොදු රාජ්‍යතාන්ත්‍රික ප්‍රයත්නවල නිරත විය හැකිය. පොදු සංසද, සමුළු සහ වටිනා ආරම්භයන් සඳහා ඔවුන්ගේ මැදිහත්වීම සමාජ ආකල්ප කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ හැකිය. මේ අනුව සමාජ ප්‍රතිසන්ධානය කෙරෙහි ආගමේ දායකත්වය පුළුල් වපසරියක් තුළ පැතිරී ඇති ආකාරය හඳුනාගතහැකිය. එහිදී ආගමික ඉගැන්වීම්, ආගමික නායකයන්ගේ භූමිකාව සුරක්ෂිත සමාජයක් ගොඩනැගීම කෙරෙහි සුවිශේෂී මෙහෙයක් ඉටුකරන බව නිගමනය කළහැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Edwards, K. L. (2016). The Space Between: Exploring How Religious Leaders Reconcile Religion and Politics. *Journal for the Scientific Study of Religion*, *55*(2), 271–287. http://www.jstor.org/stable/26651435

Jayathilaka, A., & Ansari, M. (2019). Role of Religious Leaders in Reconciliation Process in Sri *International Journal of Research and Innovation in Social Science (IJRISS)*, *3*. https://www.researchgate.net/profile/Aruna-Jayathilaka/publication/342380039_Role_of_Religious_Leaders_in_Reconciliation_Process_in_Sri_Lanka/links/5ef1bfe992851ce9e7fcd737/Role-of-Religious-Leaders-in-Reconciliation-Process-in-Sri-Lanka.pdf

Karić, T., & Mihić, V. (2020). Construing reconciliation – lay people definitions in Bosnia and herzegovina: A qualitative approach. *Primenjena Psihologija*, *13*(2), 211–242. https://doi.org/10.19090/pp.2020.2.211-242

Odak, S. (2021). Religion, Conflict, and Peacebuilding: The Role of Religious Leaders in Bosnia and Herzegovina. DOI: 10.1007/978-3-030-55111-7. https://www.researchgate.net/publication/348122758,

Omerovic, N. (2017). The Role of Religious Leaders in the Process of Reconciliation in Bosnia and Herzegovina: The Case of Bosnian Imams. https://openaccess.ihu.edu.tr/xmlui/handle/20.500.12154/62?show=full

Smock., D. R.(2006). Religious Contributions to Peacemaking: When Religion Brings Peace, Not War, United States institute of peace. 2006. https://www.usip.org/sites/default/files/PWJan2006.pdf

Steele , D., Patton, J., & Maassarani, T. (2023). Religion and reconciliation- Action guide, United States Institute of Peace Press 2301 Constitution Avenue, NW Washington, DC 20037 www.usip.org. https://www.usip.org/sites/default/files/Religion-and-Reconciliation-Action-Guide.pdf

Tenaw, D. (2018). The Role of Religious Institutions for Conflict Management: Experience of National Council of Churches of Kenya, International Journal of Humanities, Art and Social Studies (IJHAS), Vol. 3, No.1, February 2018. https://airccse.com/ijhas/papers/3118ijhas01.pdf

Sundqvist, J.(2011). Reconciliation as a Societal Process A Case Study on the Role of the Pentecostal Movement (ADEPR) as an Actor in the Reconciliation Process in Post-genocide Rwanda, Swedish Missiological Themes, 99, 2 (2011). http://www.diva-portal.org/smash/get/diva2:662445/FULLTEXT02.pdf

The University of Edinburgh/Project on Religion and Ethics in the Making of War and Peace, and the Center for Empirical Research on Religion in Bosnia and Herzegovina. (2013). Factors in Reconciliation: Religion, Local Conditions, People and Trust Results From A Survey Conducted in 13 Cities Across Bosnia and Herzegovina in May 2013, ISSN 2232-8637 - Published as a Special Issue of the Journal Diskursi. https://www.research.ed.ac.uk/portal/files/14773613/Factors_in_Reconciliation.pdf

* **Received: June, 2024| Accepted: July, 2024| Revised: October, 2024**